(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 43.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 ජනවාරි මස 12 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ලාල් ග්‍රේරු මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා,** වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

M. No. 43

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මලිත් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු  අශෝක ප්‍රියන්ත මහතා

ගරු  එස්. ප්‍රේමරත්න මහතා

ගරු  බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු  තාරක බාලසූරිය මහතා

ගරු  විජිත බේරුගොඩ මහතා

ගරු  එස්. එම්. මරික්කාර් මහතා

ගරු  ඉම්රාන් මහරූෆ් මහතා

ගරු  අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු  අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු  තිලක් මාරපන මහතා

ගරු  (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු  එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු  සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු  (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු  සී. බී. රත්නායක මහතා

ගරු  ප්‍රසන්න රණතුංග මහතා

ගරු  ප්‍රසන්න රණවීර මහතා

ගරු  කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු  ඉෂාක් රහුමාන් මහතා

ගරු  මුජිබුර් රහුමාන් මහතා

ගරු  හර්ෂණ රාජකරුණා මහතා

ගරු  නාමල් රාජපක්ෂ මහතා

ගරු  මහින්ද රාජපක්ෂ මහතා

ගරු  අංගජන් රාමනාදන් මහතා

ගරු  ගාමිණී ලොකුගේ මහතා

ගරු  ජානක වක්කුඹුර මහතා

ගරු  පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු  විදුර වික්‍රමනායක මහතා

ගරු  ඒ. ඒ. විජේතුංග මහතා

ගරු  (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු  රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු  ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු  චමින්ද විජේසිරි මහතා

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු තේනුක විදානගමගේ මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු ඊ. සරවනපවන් මහතා**

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

**ගරු මුත්තු සිවලිංගම් මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** නියෝජ්‍ය කථානායකතුමා මතු පළවන නිවේදන කරන ලදී,—

**I**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව, 2015 දෙසැම්බර් මස 19 වන දින කථානායකතුමා විසින් විසර්ජන පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**II**

"දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)" සහ "අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)" නැමැති පනත් කෙටුම්පත් පිළිබඳ නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

"දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)" සහ "අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)" යන පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු නොකරන බව රජය විසින් දන්වා ඇති බව නීතිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට කරන ලද දැනුම් දීම මත එකී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනු කර තිබූ පෙත්සම් තවදුරටත් පවත්වාගෙන නොයන බව පෙත්සම්කරුවන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට දන්වා ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කථානායකතුමා වෙත දැනුම් දී ඇති බව දන්වනු කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා විසින්, (136 වැනි අධිකාරය වූ) පඩිපාලක සභා ආඥාපනතේ 63 වැනි වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය පිළිගන්වන ලදී.

එම වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්—

(i) 2015 ඔක්තෝබර් මස 6 දින ඇති කර ගත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව සහ පෝලන්ත ජනරජ ආණ්ඩුව අතර ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මග හැරීම වැළැක්වීම සඳහා වූ ගිවිසුම;

(ii) 1988 අංක 83 දරන පනතින් සංශෝධිත (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10(අ) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 සැප්තැම්බර් 22 දිනැති අංක 1933/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 සැප්තැම්බර් 17 දිනැති අංක 1932/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 සැප්තැම්බර් 22 දිනැති අංක 1933/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ඔක්තෝබර් 01 දිනැති අංක 1934/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ඔක්තෝබර් 09 දිනැති අංක 1935/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ඔක්තෝබර් 28 දිනැති අංක 1938/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(viii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 20 දිනැති අංක 1941/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වන ලදී.

එම ලිපිලේඛනාදිය **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**3. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2016 ජනවාරි මස 26 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**4. ක්ෂුද්‍රමූල්‍ය :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යනු ලබන සමාගම් සඳහා බලපත්‍රදීම, ඒවා නියාමනය හා අධීක්ෂණය කිරීමට ද; ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන වශයෙන් සීමිත ඉතිරි කිරීමේ තැන්පතු භාරගන්නා රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම; ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සහ ක්ෂුද්‍ර ණය රාජ්‍ය නොවන සංවිධාන නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා ප්‍රමිති ස්ථාපිත කිරීමට සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2016 ජනවාරි මස 26 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**5. ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) :** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා වෙනුවෙන් පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකාවේ ථේරවාදී භික්ෂූන්ගේ නිකාය හෝ පාර්ශවයන්ට අදාළව කතිකාවත් සම්පාදනය කර ලියාපදිංචි කිරීම සඳහා ද; සෑම භික්ෂූන් වහන්සේ නමක් විසින් ම එකී භික්ෂූන් වහන්සේට අදාළ වන නිකායේ හෝ පාර්ශවයේ ලියාපදිංචි කතිකාවතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු බවට විධිවිධාන සැලැස්වීම සඳහා ද; යම් ලියාපදිංචි කරන ලද කතිකාවතක විධිවිධානවලට පටහැනිව කටයුතු කරන භික්ෂූන් වහන්සේලාට දණ්ඩන පැනවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2016 ජනවාරි මස 26 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ අංක 7 දරන ස්ථාවර නියෝගයෙහි සහ 2015.10.06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ විධිවිධානයන්හි කුමක් සඳහන්ව තිබුණද, 2016.01.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 1.30 දක්වා විය යුතු ය. අ.භා. 1.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2016 ජනවාරි මස 26 වැනි අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය පත්කිරීම සඳහා යෝජනා සම්මතය :** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.(2016 ජනවාරි 09),— ශ්‍රී ලංකාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගත යුතු යැයි ශ්‍රී ලාංකික ජනතාව අතර පුළුල් එකඟතාවයක් ඇති හෙයින් ද;

2015 ජනවාරි මස 08 වැනි දින පැවති ජනාධිපතිවරණයේදී නීතියේ ආධිපත්‍යයට ගරු කෙරෙන සහ ප්‍රජාතන්ත්‍රවාදය සවිමත් කෙරෙන දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීමෙහි ලා පැහැදිලි ජනවරමක් ජනතාව විසින් ලබාදී ඇති හෙයින් ද;

ඉහත කී ජනාධිපතිවරණයේදී ජනතාව ප්‍රකාශ කරන ලද අභිප්‍රාය බලගැන්වීමට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කෙරෙන්නා වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මතකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විසින් සිය අභිලාෂය පැහැදිලිව ප්‍රකාශකර ඇති හෙයින් ද;

විධායක ජනාධිපති ධූරය අහෝසි කෙරෙන්නාවූ ද, මනාප ඡන්ද ක්‍රමය ඉවත් කර ජනතා නියෝජනය සාධාරණව පිළිබිඹු කරන්නා වූ මැතිවරණ ක්‍රමයක් සහතික කෙරෙන්නා වූ ද, සියලු පුරවැසියන්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් ශක්තිමත් කරන්නාවූ ද, ජාතික ප්‍රශ්නයට ව්‍යවස්ථාමය විසඳුමක් සපයන්නාවූ ද, ජාතික ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කරන්නා වූ ද, නීතියේ ආධිපත්‍යයට ගරු කෙරෙන දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කරන්නා වූ ද, ජනතාවගේ මූලික අයිතීන් හා නිදහස මගින් මානව අභිමානය තහවුරු කරන්නාවූ ද වගකිව යුතු, වගවන්නාවූ ආණ්ඩු ක්‍රමයක් ප්‍රවර්ධනය කරන්නා වූ ද, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මතකර ගැනීමේ අවශ්‍යතාවය මතුවී ඇති හෙයින් ද;

1. ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම පිළිබඳව සලකා බලා ජනතාවගේ අදහස් හා උපදෙස් ලබාගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන ව්‍යවස්ථාව යටතේ ඒ වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් පාර්ලිමේන්තුව විසින් සලකා බලනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතක් සැකසීමේ කාර්ය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විතවන මෙහි මින් මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන පාර්ලිමේන්තු කාරක සභාවක් තිබිය යුතු යැයි, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.
2. පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් තෝරා පත්කර ගත යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිවරයන් හත් (7) දෙනෙකු සිටිය යුතු ය.

ගරු කථානායකතුමා නොපැමිණි අවස්ථාවන්හිදී, මණ්ඩලයේ රැස්වීම්වල මුලසුන හොබවනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිවරයන් අතුරින් අයෙකු තෝරා පත් කළ යුතු ය.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූරණය විස්සක් (20) ක් විය යුතු ය.

4. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා උපදේශකවරුන්;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සඳහා නීති ලේකම්වරයෙකු හා එකී නීති ලේකම්වරයා සඳහා සහායකයින්;

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා 5 වන වගන්තියේ යොමුගත කමිටුවල කටයුතු වාර්තාකරණය පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සඳහා කාර්ය මණ්ඩලය; සහ

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ (සමාජ මාධ්‍ය ඇතුළුව) මාධ්‍ය කාර්ය මණ්ඩලයක්;

සිටිය යුතුය.

ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය ප්‍රචාරණය ලබාදීමෙහිලා මාධ්‍ය කාර්ය මණ්ඩලය විසින් වෙබ් අඩවියක් පිහිටුවා එය පවත්වාගෙන යා යුතු අතර වෙනත් සුදුසු මාධ්‍ය ද යොදා ගත යුතු ය.

අදාළ සෙසු ප්‍රවීණයන්ගේ හෝ විශේෂඥ මතද ඇතුළත්ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා එහි කාරක සභාවන්හි කටයුතු මෙන්ම මහජන අදහස් / කරුණු ඉදිරිපත් කිරීම්ද, එම වෙබ් අඩවියෙහි ලේඛනගත කොට ප්‍රකාශයට පත්කරන බවට මාධ්‍ය කාර්ය මණ්ඩලය සහතික විය යුතු ය.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය පහත සඳහන් අනු කමිටුවලින් සමන්විත විය යුතු ය:—

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් පත් කරනු ලබන, අග්‍රාමාත්‍යවරයා (සභාපති), පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශවයේ නායකවරයා, අධිකරණ අමාත්‍යවරයා හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සෙසු සාමාජිකයින් දහහත් (17) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් යුත් මෙහෙයුම් කමිටුවක්;

මෙහෙයුම් කමිටුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතු හා ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ කාර්යය සඳහා වගකිව යුතු ය.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් පත්කළ හැකි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත සෙසු අනු කමිටු;

එසේ වුවද, එක් එක් අනු කමිටුවක සාමාජික සංඛ්‍යාව එකොළහ (11) කට නොවැඩි විය යුතු ය.

එක් එක් අනු කමිටුවේ සභාපතිවරයා මෙහෙයුම් කමිටුව විසින් පත්කරනු ලැබිය යුතු ය.

6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් එහි පළමු රැස්වීමේදී—

(අ) නියෝජ්‍ය සභාපතිවරයන් තෝරා පත්කර ගත යුතු ය;

(ආ) 5(ආ) වගන්තියේ යොමුගත අනු කමිටු තීරණය කළ යුතු ය; සහ

(ඇ) 5 වගන්තියේ යොමුගත අනු කමිටුවලට සාමාජිකයින් තෝරාපත් කර ගත යුතු ය.

7. අමාත්‍ය මණ්ඩලයට හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රථම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් සලකා බලනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් යෝජනා කරමින් යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස මෙහෙයුම් කමිටුවෙන් ඉල්ලා සිටිමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් සම්මත කරනු පිණිස අග්‍රාමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ පළමුවැනි රැස්වීමේදී යෝජනාවක් ඉදිරිපත් කළ යුතු ය.

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය වෙත ස්වකීය රැස්වීම් පාර්ලිමේන්තුවේ සභා ගර්භයෙහි පැවැත්වීමට මෙයින් බලය පවරනු ලැබේ,

එසේ වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට බස්නාහිර පළාතෙන් පිටත වූ වෙනයම් නිශ්චිත ස්ථානයකදී සිය රැස්වීම් පැවැත්වීමට තීරණය කළ හැකිය.

එසේම, තව දුරටත්, ලිපිලේඛන ඉදිරිපත් කිරීම, යෝජනා ඉදිරිපත් කිරීම හා යම් කරුණක් සම්බන්ධයෙන් ඡන්දය ලබාදීම පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ දී පමණක් සිදුවිය යුතුය.

9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හෝ එයට අයත් යම් කමිටුවක අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් කමිටුවට අවශ්‍ය සේවාවන් අවශ්‍ය වන්නා වූ ඕනෑම ආයතනයකින් ලබාගත යුතු ය.

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට හා /හෝ එහි විවිධ අනුකමිටුවලට සහයවනු පිණිස හා උපදෙස් ලබාදෙනු පිණිස සෙසු ප්‍රවීණයන් මෙහෙයුම් කමිටුව විසින් පත්කරනු ලැබිය හැකිය.

11. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතු මහජනතාවට විවෘත විය යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා අනු කමිටුවල කටයුතු ලේඛනගත කොට වහා ප්‍රකාශයට පත් කළ යුතු ය. සුදුසු අවස්ථාවන්හි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා/හෝ එහි අනු කමිටුවල කටයුතු විකාශනය කිරීම සහතික කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

සැක ඇතිවීම වළක්වනු පිණිස, පෙර කී කරුණු ප්‍රකාශනය සඳහා පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාර, පාර්ලිමේන්තුවේ විශේෂ අවසරය නිශ්චිතව ලබා දෙනු ලබන බවට මෙහිලා නිශ්චිත වශයෙන්ම යෝජනා කෙරේ.

සැක ඇතිවීම වළක්වනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා පස්වන වගන්තියේ යොමුගත අනු කමිටුවල කටයුතු පාර්ලිමේන්තුව වෙත සමගාමීව වාර්තා කර ඇත්තා සේ හා මෙහිලා නිශ්චිත වශයෙන්ම බලය ලබාදෙනු ලබන යම් කටයුතු ප්‍රකාශයට පත් කිරීම් මඟින් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත ප්‍රකාර වරදක් සිදු නොවනු ඇති බව තවදුරටත් යොජනා කෙරේ.

12. උපදෙස් ලබාගැනීම සඳහා සහ/හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීම සඳහා ඕනෑම පුද්ගලයෙකු කැඳවීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට තිබිය යුතු ය.

13. මහජන අදහස් ලබාගැනීමේ කමිටුවේ නිර්දේශ පිළිබඳ උපදෙස් ලබාගැනීම සහ / හෝ කරුණු ඉදිරිපත් කිරීම සහ / හෝ වාර්තා කිරීම සඳහා මහජන අදහස් ලබාගැනීමේ කමිටුවේ ඕනෑම සාමාජිකයෙකු කැඳවීමේ බලය ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට තිබිය යුතු ය.

14. මෙහි දක්වා ඇති විධිවිධානවලට යටත්ව, ස්වකීය කටයුතු ඉටුකිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය හා යාන්ත්‍රණයන් පිළිබඳ තීරණය කිරීමේ බලය ද මෙහිලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට පවරනු ලැබේ:

එසේ වුවද, එකී තීරණය මෙහෙයුම් කමිටුවේ එකඟත්වය ඇතිව අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා සම්මතයකට පසුව ගත යුතු ය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට පටහැනිව කුමක් සඳහන් වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සහ එහි අනුකමිටුවල කාර්ය පරිපාටික රීති මෙම යෝජනා සම්මතයේ දක්වා ඇති පරිදි විය යුතුය.

15. මෙහෙයුම් කමිටුව විසින් ලබා දෙනු ලබන අනුමතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතු පිළිබඳ දැන්වීම අග්‍රාමාත්‍යවරයා හෝ අග්‍රාමාත්‍යවරයා විසින් ඒ

සඳහා කලින් කලට නම් කරනු ලබන වෙනත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු විසින් කරනු ලැබිය යුතු ය.

16. 5(ආ) වගන්තියේ යොමුගත එක් එක් අනු කමිටුවක් පත්කිරීමෙන් සති දහයක් (10) ඇතුළත එම අනු කමිටු විසින් ස්වකීය වාර්තා මෙහෙයුම් කමිටුව වෙත භාර දෙනු ලැබිය යුතු ය.

17. 5(ආ) වගන්තිය යටතේ පත්කරන ලද අනු කමිටුවල සහ මහජන අදහස් ලබාගැනීමේ කමිටුවේ වාර්තා සලකා බැලීමෙන් අනතුරුව මෙහෙයුම් කමිටුව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. එකී වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් ද සමඟ ඉදිරිපත් කළයුතු ය.

18. ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් වාර්තාවේ හා (අදාළ වන්නේ නම්) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි පොදු යෝග්‍යතාවයන් හා මූලධර්ම විවාදයට ගනු ලැබ යෝජිත සංශෝධන ද විවාදයට ගනු ලැබිය යුතු ය. එවැනි විවාදයන් අවසානයේදී "අවසාන වාර්තාවක් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත පිළිබඳ යෝජනා සම්මතයක් මෙහෙයුම් කමිටුව විසින් ඉදිරිපත් කළ යුතු ය." යනුවෙන් මූලාසනය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

19. ඉනික්බිතිව, මෙහෙයුම් කමිටුව විසින් විවාදය අතරතුර යෝජිත යම් සංශෝධනයන් වේ නම්, ඒවා ද සැලකිල්ලට ගනිමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් සළකා බලනු පිණිස අවසාන වාර්තාවක් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් ද ඉදිරිපත් කළ යුතු ය. එකී වාර්තාව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් අනුමත කළයුතු බවට යෝජනා සම්මතයක් අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

20. 18 වන වගන්තියෙහි යොමුගත විවාද කාල සීමාව තුළ පහත සඳහන් ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය:—

සභාපතිවරයා හෝ සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, යම් නියෝජ්‍ය සභාපතිවරයෙකු විසින් එක් එක් වගන්තිය අංක පිළිවෙළින් කියවිය යුතු ය.

(i) යම් වගන්තියකට සංශෝධනයක් ගෙන ඒම, හෝ වගන්ති ඉවත් කිරීම හෝ නව වගන්ති ඇතුළත් කිරීම හෝ කළ හැකිය.

(ii) විවාදය මෙම අදියර තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි විස්තර විනා එහි මූලධර්මය සාකච්ඡාවට නොගත යුතු ය.

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි යම් පූර්ව කොටසක් මත එළැඹි යම් තීරණයක් හා අනනුකූල කිසිදු සංශෝධනයක් යෝජනා කළ නොහැකිය.

(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත කියවා අවසන් කරන ලදුව, එකී කෙටුම්පත පිළිබඳ විවාදය අවසන් කිරීමට ප්‍රථම, යම් සාමාජිකයෙකුට, සභාපතිවරයාගේ අවසරය මත, ඒ වනවිට ද සම්මතකර ඇති යම් වගන්තියකට සංශෝධනයක් යෝජනා කළ හැකිය.

(v) යම් වගන්තියකට ගෙන එනු ලබන සංශෝධනයක් පිළිබඳ වූ ප්‍රශ්නයක් මුළුමනින්ම මූලාසනය විසින් ඉදිරිපත්කර ඇත්තේ නම් විනා වගන්තියක් කල් දැමිය හැක.

(vi) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි ඉතිරි වගන්ති සලකා බැලීමෙන් අනතුරුව හා නව වගන්ති ගෙන ඒමට ප්‍රථම කල්තැබූ වගන්ති සලකා බැලිය යුතු ය.

(vii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි උපලේඛන සලකා බැලීමට ප්‍රථම නව වගන්ති ඉදිරිපත් කළ හැකි අතර ඒවා පළමු වැනි වර කියවූවා සේ සැලකිය යුතුය. ඉනික්බිතිව, එළඹෙන ප්‍රශ්න "වගන්තිය දෙවනවර කියවිය යුතුය" හා

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට වගන්තිය (හෝ සංශෝධිත පරිදි වූ වගන්තිය) එකතු කළ යුතු ය" වේ.

(viii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි උපලේඛන ඉවත් කිරීමෙන් අනතුරුව නව උපලේඛන ඉදිරිපත් කළ හැකි අතර ඒවා නව වගන්ති ස්වභාවයෙන්ම සැලකිය යුතු ය.

(ix) සෑම වගන්තියක් හා උප ලේඛනයක්ම සහ යෝජිත නව වගන්තියක් හෝ උප ලේඛනයක් සම්බන්ධ කටයුතු කළ පසුව, යම් පූර්විකාවක් වන්නේ නම් එය සලකා බලා "මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි පූර්විකාව විය යුතුය" යන ප්‍රශ්නය ඉදිරිපත් කළ යුතු ය.

(x) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි නාමයට යම් සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම්, සවිස්තරව දක්වා ඇති ඉහත කී කාර්යාවලීන් අවසානයේදී එය සිදුකළ යුතු ය.

21. අවශ්‍ය වෙනස් කිරීම් සහිතව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 42, 43 හා 44 හි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතුවලට අදාළ විය යුතු ය.

22. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සභිකයන් අතරින් තුනෙන් දෙකක් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත අනුමත නොකරන්නේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සහ මෙකී යෝජනාවේ යොමුගත කමිටු විසුරුවා හැරියා සේ සැලකිය යුතු ය.

23. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් අනුමත කරන්නේ නම්, වාර්තාව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත මෙහෙයුම් කමිටුව විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතු අතර, ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සහ මෙකී යෝජනාවේ යොමුගත අනුකමිටු විසුරුවා හැරියා සේ සැලකිය යුතු ය.

24. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75(ආ) ව්‍යවස්ථාව හා 120(ආ) ව්‍යවස්ථාව ප්‍රකාර මුළුමනින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රතියෝජනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් වශයෙන් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාව මඟින් විධිවිධාන සලසා තිබෙන පරිදි විශේෂ බහුතරයකින් සම්මත කරගනු ලැබ ජනමත විචාරණයක් මඟින් ජනතාව වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරෙන පනත් කෙටුම්පතක් වශයෙන් එකී වාර්තාවේ අන්තර්ගත පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කළ යුතු ය.

25. ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78(1) ව්‍යවස්ථාව ප්‍රකාර එකී පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

26. ඉන්අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ(2) ව්‍යවස්ථාව ප්‍රකාරව, සෑම පළාත් සභාවකම අදහස් ප්‍රකාශ කිරීමට ජනාධිපතිවරයා විසින් එකී පනත් කෙටුම්පත එකී සෑම සභාවකටම යොමු කරනු ලැබිය යුතු ය.

27. ඉනික්බිතිව, අග්‍රාමාත්‍යවරයා විසින් එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය.

28. ඉහතින් සඳහන් කළ පරිදි, එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාව ප්‍රකාරව විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කරගත යුතු බවට අග්‍රාමාත්‍යවරයා එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

එකී පනත් කෙටුම්පතට පක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව පාර්ලිමේන්තුවේ සමස්ත මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට අඩු නොවේ නම්, මෙකී පනත් කෙටුම්පත විශේෂ බහුතර ඡන්දයෙන් පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද බවත්, ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍ය පිහිටා ඇති ජනතාව විසින් ජනමත විචාරණයකදී අනුමත

කරන තුරු පනත් කෙටුම්පත නීතියක් බවට පත් නොවන්නේ ය, යනුවෙන් කථානායකවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාර යෝග්‍ය සහතිකයක් ලබා දිය යුතුය.

29. ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ජනාධිපතිවරයා විසින් පනත් කෙටුම්පත ජනමත විචාරණයක් මඟින් ජනතාවගේ අනුමතිය පිණිස ඉදිරිපත් කළ යුතුය.

30. පනත් කෙටුම්පත ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කරනු ලැබ තිබේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80(2) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් සහතික කිරීම මත පනත් කෙටුම්පත නීතියක් බවට පත්වන්නේය.

31. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ, 5 වගන්තියේ යොමුගත අනුකමිටුවල, සහ මෙකී යෝජනාව ප්‍රකාරව පත්කරන ලද කාර්ය මණ්ඩලයේ හා උපදේශකවරුන්ගේ වියදම් ඒකාබද්ධ අරමුදලින් දැරිය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාව ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් යෝග්‍ය පියවර ගත යුතු ය.

32. සැකයක් ඇති නොවනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් යෝජිත ආකාරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් සම්මත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ සංශෝධනවලට යටත්ව සම්මත කිරීම පාර්ලිමේන්තුවේ වගකීම විය යුතු බවට මෙහිලා ප්‍රකාශ කෙරේ.

33. සැකයක් ඇති නොවනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතක් නොපැමිණි මන්ත්‍රීවරුන් ද ඇතුළුව පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක විශේෂ බහුතර ඡන්දයකින් පාර්ලිමේන්තුවේදී සම්මත කරනු ලැබ, ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාවේ ප්‍රකාරව ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කරන්නේ නම් පමණක් නීතියක් වශයෙන් පැනවිය යුතු බවට මෙහිලා තවදුරටත් ප්‍රකාශ කෙරේ.

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා, යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ. භා. 11.41 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

"විවාදය දැන් කල් තැබිය යුතුය"යි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඊට අනුකූලව විවාදය කල් ගියේය; එතැන් සිට විවාදය ඉදිරි දිනයක පවත්වනු ලැබේ.

**9. කල් තැබීම :** එකල්හි වේලාව අ. භා. 1.30 පසුකර තිබුයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 2.30 ට, අද දින සභා සම්මතිය අනුව 2016 ජනවාරි මස 26 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් කල් ගියේය.